# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,923 - 2015 ජූලි මස 10 වැනි සිකුරාදා - 2015.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1168 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1169 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1175 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1179 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1181 |


*සැ. යු.- දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත, 2015 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.*

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට්* පත්‍රයේ දැන්වීම් 2015 ජූලි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රාජසන්තක කරන ලද මෝටර් වාහන විකිණීම

මහාධිකරණය, අනුරාධපුර

මෙම අධිකරණ කලාපයට අයත් අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත මෝටර් වාහන විකිණීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| අනු. අංකය | නඩු අංකය | වාහනය | ටෙන්ඩර් ඇප තැන්පත් ආපසු ගෙවන රු. ශ. | ටෙන්ඩර් ඇප තැන්පත් ආපසු නොගෙවන රු. ශ. |
|---|---|---|---|---|
| 01. | 8817 | 227-9129 ලේලන්ඩ් වර්ගයේ ලොරි රථය | 10,000.00 | 200.00 |
| 02. | 29649 | EP LE 9193 ටාටා වර්ගයේ බට්ටා ලොරි රථය | 5,000.00 | 200.00 |
| 03. | 25695 | EP PQ 3495 මහෙන්ද්‍රා කැබ් රථය | 5,000.00 | 200.00 |
| 04. | 34222 | NC GP 2908 කැන්ටර් ලොරි රථය | 10,000.00 | 200.00 |

01. 2015 ජූලි මස 08 වැනි දින සිට 2015 ජූලි මස 21 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 1.00 දක්වා අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී, ඉහත සඳහන් වාහන පරීක්ෂා කර බැලිය හැකි ය.

02. එක් එක් වාහනය සඳහා ඉහත දක්වෙන පරිදි ආපසු නොගෙවන තැන්පත් මුදලක් අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණ හෝ අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලදුපත් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කර ලංසු ආකෘති පත්‍ර 2015 ජූලි 08 වැනි දින සිට 2015 ජූලි 21 වැනි දින පෙ. ව. 10.00 සිට ප. ව. 1.00 දක්වා කාලය තුළ ලබාගත හැකි අතර එම කාලය තුළ දී ආපසු ගෙවන තැන්පත් මුදල අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලබා ගන්නා ලදු පත ලංසු අයදුම්පතට ඇමිණිය යුතු ය.

03. එක් එක් වාහනය සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතු අතර ලංසු කොන්දේසි පරිදි සම්පූර්ණ කොට මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර එම කවර දෙකම එක් කවරයක බහා මුද්‍රා තැබිය යුතු ය. එම මුල් කවරයේ වම් පස ඉහළ කෙළවරේ මෝටර් වාහන සඳහා මිල ගණන් ලෙස ද වාහනයේ අංකය ද සඳහන් කර 2015 ජූලි මස 22 වැනි දින පෙ. ව. 11.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

සභාපති,<br>
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,<br>
මහාධිකරණය,<br>
අනුරාධපුර.

04. එදිනම පෙ. ව. 11.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවේ දී ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

ධම්මික ගනේපොල,<br>
මහාධිකරණ විනිසුරු,<br>
අනුරාධපුරය.

2015 ජූනි මස 16 වැනි දින,<br>
අනුරාධපුර මහාධිකරණයේ දී ය.

07-319

**මහාධිකරණය - නුවරඑළිය**

නුවරඑළිය මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත උපලේඛනයේ දක්වෙන හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා 2015 අගෝස්තු මස 07 වැනි දින දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

02. එක් එක් අයිතමය සඳහා වෙන වෙන ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා ආපසු නොගෙවන රු. 100 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා නියමිත ආකෘති පත් හා විස්තර නුවරඑළිය මහාධිකරණයෙන් ලබා ගත යුතු ය. ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ 2015 අගෝස්තු මස 04 වැනි දින දක්වා පමණි.

03. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් ද අධිකරණයේ තැන්පත් කළ යුතු අතර, අදාළ මුදල උපලේඛනයේ දක්වා ඇත. ටෙන්ඩර් පත්‍රයේ පිටපත් දෙක සමග මුදල් ගෙවන ලද කුවිතාන්සි, ඡායා පිටපතක් ද අමුණා එවිය යුතු අතර ටෙන්ඩර්පත් ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ ''වාහන සඳහා මිල ගණන්, වාහන අංකය ............................'' යනුවෙන් සඳහන් කර නුවරඑළිය මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. වාහන පරීක්ෂා කිරීම 2015 අගෝස්තු මස 04 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවලදී හැටන් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කාර්යාල වේලාව තුළ දී පරීක්ෂා කළ හැකි ය.

05. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකි අතර, 2015 අගෝස්තු මස 13 වැනි දින ප. ව. 2.00 ට නුවරඑළිය මහාධිකරණයේ දී කලාපීය ප්‍රසම්පාදන කමිටුව මගින් ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

06. ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දීම ලැබී දින 03ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම ගෙවා වාහන ඉවත් කර ගත යුතු ය.

07. ටෙන්ඩර් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 051 - 2222291 ඔස්සේ හැටන් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ලබා ගත හැකි ය.

*උපලේඛනය*

| *නඩු. අංකය* | *වාහන ලියාපදිංචි අංකය* | *වර්ගය/මාදිලිය* | *ඇප තැන්තුව රුපියල්* | *වාහන පරීක්ෂා ස්ථානය* |
|---|---|---|---|---|
| 58067 | CP QV - 5900 | ත්‍රීවිල් රථය | 1,000.00 | හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය |
| 40333 | CP QM - 9726 | ත්‍රීවිල් රථය | 1,000.00 | හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය |
| 60963 | CP LI - 9718 | ලොරි රථය | 5,000.00 | හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය |

ඊ. ඩබ්. එම්. ලලිත් ඒකනායක,
මහාධිකරණ විනිසුරු (මධ්‍යම පළාත),
නුවරඑළිය.

2015 අගෝස්තු මස 23 වැනි දින,
නුවරඑළිය මහාධිකරණයේ දී ය.

07-509

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**2016 වර්ෂය සඳහා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලට ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළකරන ලද, රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2015.09.03 වැනි දින පෙ. ව. 10.30 දක්වා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිළදී ගැනීමට ඉදිරිපත් වන අය නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නියම කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප් ශාඛාවකින් ලබාගත් කුවිතාන්සියක් ද ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන, රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සමඟ කවරයක බහා එයට මුද්‍රා තබා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන රා තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන

අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක. නියමිත ආකෘතිපත්‍ර ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකිය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2015 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ. ව. 10.30 ට සියලු ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පෙනී සිටිය යුතු ය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කරන දින ප. ව. 2.00 ට මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා, විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. රා තැබෑරුම පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර්කරුවන් විසින් මහජන විරෝධතාවයක් පැන නොනගින සුදුසු ස්ථානයක් තෝරා ගත යුතු ය. තෝරාගත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ඒ සඳහා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

08. 2015 සැප්තැම්බර් මස 03 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2015.10.28 වැනි දින පෙ. ව. 10.30ට නැවත රේන්දය විකිණීම මෙම ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය වේ නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ආර්. එම්. පී. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
මල්ලවපිටිය.

2015 ජූලි මස 24 වැනි දින.

උපලේඛනය

**මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම් - 2016**

| *අංකය සහ නම* | *පත්තුව* | *තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශ* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් වසන දිනය සහ වේලාව* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| කටුපිටිය අංක 01 | වැඋඩ විල්ලි හත්පත්තුව | කටුපිටිය | 1,000 | 2015.09.03 පෙ. ව. 10.30 | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

07-575

---

**2016 වර්ෂය සඳහා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්දය විකිණීම**

2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව, 2015.08.03 වැනි දින පෙරවරු 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියමකර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් ඉහළ කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් භාර ගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2014.08.03 වැනි දින පෙරවරු 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බදුල්ල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2015.09.30 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණු දින පස්වරු 2.00 ට පෙර බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැන ගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිවේ.

පී. එස්. පී. අබේවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2015 ජුනි මස 24 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

**2016 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම පිළිබඳ විස්තර "බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය"**
**2016.01.01 වැනි දින සිට 2016.12.31 වැනි දින දක්වා**

| *තැබෑරුමේ නම සහ ලිපිනය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රා. ලේ. කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| බදුල්ල අංක 01 රා තැබෑරුම | බදුල්ල | බදුල්ල මහ නගර සභා අංක 06 දරන කොට්ඨාසයේ හුණුකොටුව නමැති රජයේ ඉඩම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 5,000 | 2015.08.03 පෙ.ව. 10.30 |

***නැවත විකුණන දිනය*** .- සාර්ථක ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවුවහොත් 2015.09.30 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකිණීම සිදු කෙරේ.

07-475

## නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - අනුරාධපුර

### රා තැබෑරුම් රේන්ද විකිණීම - 2016 වර්ෂය

2016 වර්ෂයට පහත දැක්වෙන තැබෑරුමේ පැසුණු රා විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර පහත සඳහන් කොන්දේසිවලට යටත් ව භාරගනු ලැබේ :-

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි,

(ii) සියලු සුරාබදු නීතිය යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

02. මෙම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටෙන්ඩර් පතක්ම රු. 2,000 ක මුදලක් ගෙවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කළ යුතු ය.

03. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය සමග ඔවුන්ට අයත් නිශ්චල දේපළවල වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය මහලේකම් තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතු ය. එය තැබෑරුමට ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමින් සියයට පහළොවකට (15%) නොඅඩු සහතිකයක් විය යුතු ය. මෙම ජේදයේ සඳහන්වන සහතිකයට අදාළ නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළ දී විකිණීමට හෝ පැවරීමට තහනම් වන්නේ ය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවා සේ සැලකේ.

04. සෑම ටෙන්ඩර්පතක් ම සීල් තබන ලද කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ ''2016 වර්ෂය සඳහා අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කර 2015 අගෝස්තු මස 03 වැනි දින පෙරවරු 10.30 ට පෙර අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම් ඒවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත සඳහන් පරිදි එවිය යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදල ගෙවිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල තැන්පත් කිරීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එය පැහැර හරින්නාගේ නම සියලු සුරාබදු බලපත්‍රවලට අදාළ පැහැර හරින්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :-

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රදේශය හා කොටස* | *තැබෑරුම විවෘත කරන වේලාව* |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | අනුරාධපුර නව නගරයේ නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා |

09. තනි බලයලත් පුද්ගලයා විසින් එහි අට (08) වැනි ජේදයේ සඳහන් ප්‍රාදේශීය ලේකම් විසින් වෙන් කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස් කළ යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් යෝජිත ස්ථානයක් සපයාගත යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර, එසේ කිරීමට ගතයුතු අනුමැතිය බලය ලැබීමේ අනුමැතිය ආරම්භවීමට දින 14 කට පෙර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත යුතු ය.

10. රා තැබෑරුම පවත්වාගෙන යන ගොඩනැගිල්ල කිසියම් රජයේ ආයතනයකට සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට අයත් වන විට රේන්දයට අදාළ සම්පූර්ණ කාලයට එම ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ ආයතනයට බද්ද ගෙවා ඒ බැව් ගිවිසුමේ අත්සන් කිරීමට පෙර සනාථ කළ යුතු ය.

11. මේ සම්බන්ධයෙන් විස්තර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ය.

12. *වැදගත්* .- 2015.08.03 වැනි දින රා රේන්ද විකිණීමට නොහැකි වුවහොත් 2015.09.10 වැනි දින පෙරවරු 10.30 ට නැවත විකුණනු ලැබේ.

ඩබ්. එම්. රුවන් විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුර.

2015 ජූනි මස 22 වැනි දින.

07-449

**2016 වර්ෂයට හම්බන්තොට කොට්ඨාසයේ රා රේන්ද විකිණීම**

2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පහත උපලේඛනයේ විස්තර සඳහන් රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා පොදුවේ සෑම සුරාබදු බලපත්‍රයක් ම වෙනුවෙන් දැනට බලපවත්නා හා ඉදිරියට බලපැවැත්විය හැකි කොන්දේසිවලට යටත් ව හම්බන්තොට කොට්ඨාසයේ පිහිටි අංක 01 දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 5,000 ක් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් නියමිත පෝරමය ඉදිරිපත් කළ යුතු ය. තව ද ටෙන්ඩර්කරු විසින් පහත සඳහන් *ගැසට්* නිවේදනයේ පරිදි වත්කම් සහිත සහතික ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිහිටි ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතුය. නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හා 1982.08.20 දින අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1982 වර්ෂයේ රා රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වන්නන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

04. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පස්දෙනෙකුට වඩා හවුල් වන ටෙන්ඩර් පත්‍ර ද ඉදිරිපත් කළ නොහැක.

05. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම කවරයක බහා සීල් තබා කවරයේ වම් පස මුදුණේ "හම්බන්තොට කොට්ඨාසයේ අංක 01 දරන රා තැබෑරුමේ රේන්ද සඳහා ටෙන්ඩර් - 2016" යනුවෙන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් සහිත කවරය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් 2015.08.06 වැනි දින පෙ.ව. 10.00 ඉකුත් වීමට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් වසන වේලාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්දය විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතු ය.

07. ටෙන්ඩර් පත්‍රයේ හෝ සියලුම ටෙන්ඩර්පත්‍ර හෝ නියමිත හේතුන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. කිසියම් හේතුවක් නිසා ටෙන්ඩර් භාර ගැනීමට නියමිත 2015.08.06 වැනි දිනට අවලංගු කිරීමට සිදුවුවහොත් නැවත ටෙන්ඩර්භාර ගන්නා දිනය 2015.09.15 වැනි දින වේ.

09. වැඩි විස්තර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැන ගත හැකි ය.

ඊ. කේ. ඒ. සුනීතා,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

2015 ජුනි මස 17 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**2016 වර්ෂයට හම්බන්තොට කොට්ඨාසයේ අනුමත කරන ලද රා තැබෑරුම**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර්පත් භාර ගැනීම* | *තැබෑරුම විවෘතව තැබිය යුතු වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට | හම්බන්තොට | 2015.08.06 වැනි දින පෙ.ව. 10.00 | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා |

07-308

## වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2016 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් යටත් ව 2016 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිලදී ගැනීම සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් 2015 අගෝස්තු මස 14 වැනි දින පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි අතර, නියමිත ආකෘතිපත්‍රයෙන් යුතු ටෙන්ඩර් පෝරමයකින් විය යුතු ය.

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත උපලේඛනයෙහි දැක්වෙන පරිදි ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබාගන්නා ලද නිල කුවිතාන්සිය, සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතික ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

-

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි සැලකිළිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. එහි සඳහන් ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්වල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතර ව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතේ අංකය ද යෙදිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක් ම ටෙන්ඩර් පෝර්මය සමග පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන් ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර, වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර දැමිය යුතු ය. තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීම සඳහා නියමිත වේලාව ඉක්මවීමට පෙර, වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එහි සඳහන් වේලාවට ටෙන්ඩර්කරුවන් වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් නමින් නිල්දණ්ඩාහින්න මහජන බැංකුවේ වාර්ෂික ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට ටෙන්ඩර්කරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් 'ගෙවීම සඳහා යන්න' සටහන් කරන ලද චෙක්පතින් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පත්" ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත්කොට, කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දුවන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩර් පතක් කිහිපදෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන් පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, ඒවා 2015.09.22 වැනි දින පෙරවරු 10.30ට මෙම ස්ථානයේ දී විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම්, වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

අයි. කේ. ජී මුතුබණ්ඩා,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2015 ජුනි මස 17 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *අංකය* | *රා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටුි වියයුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගන්නා දිනය හා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| අංක 04 | හරස්බැද්ද | හරස්බැද්ද ග්‍රාමය තුළ | 2015.08.14 පෙ. ව. 10.30 | 5,000.00 |
| අංක 05 | පදියපැලැල්ල | පදියපැලැල්ල ග්‍රාමය තුළ | 2015.08.14 පෙ. ව. 10.30 | 5,000.00 |

07-321

---

# රජයේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම නිවේදනය කරනු ලැබේ.

සමාගමෙ නම : සවේන් ඇග්‍රි හෙල්ප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106194
සංස්ථාපන කළ දිනය : 2015 ජුනි 10
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 193 ඒ, මෛත්‍රී පාර, වීදගම, බණ්ඩාරගම.

මල්දෙණියගේ දෙන් ආරියදස,
අධ්‍යක්ෂ.

07-549

## සමාගමක නමේ තත්ත්වය වෙනස්වීමක් පිළිබඳව කරනු ලබන නිවේදනය

සියරා ඉන්ෆොමේෂන් ටෙක්නොලොජිස් ලිමිටඩ් (පී බී 241)

2015 ජුනි 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සියරා ඉන්ෆොමේෂන් ටෙක්නොලොජිස් ලිමිටඩ් හි තත්ත්වය සියරා ඉන්ෆොමේෂන් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කිරීමට සමාගම විසින් ගන්නා ලද තීරණය පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

07-576

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : එස් ඇන්ඩ් ටී ෆාම්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 106120
ලියාපදිංචි දිනය : 2015 ජුනි 08
ලිපිනය : අංක 117/1 ඒ, ජින්තුපිටිය වීදිය කොළඹ 13.

සමාගම් ලේකම්වරු.

07-312

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : ආර් සී ඒ හෙල්ත් කෙයාර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 101580
ලියාපදිංචි දිනය : 2014 ඔක්තෝබර් 20
ලිපිනය : අංක 329/4ඒ, ලොසිත් 3 වැනි පටුමග, එකමුතු මාවත, තලංගම උතුර, බත්තරමුල්ල.

සමාගම් ලේකම්වරු.

07-313

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කල බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නාමය : ප්‍රෝමාක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 69672
සමාගම ලියාපදිංචි කල දිනය : 2009 ඔක්තෝබර් මස 23
ලියාපදිංචි කාර්යාලය : අංක 29, ශ්‍රී මහින්ද ධර්මා මාවත, කොළඹ 09.

ආයතනයේ ලේකම්.

07-314

## දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) අනුව 2015.05.21 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ෆ්‍රෙෂ් කොකොනට් එක්ස්පෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105770
ලියාපදිංචි ලිපිනය : 100, තිඹිල්ල එස්ටේට්, පුත්තලම් පාර, හලාවත, 61000

අධ්‍යක්ෂක.

07-331

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් කෑෂ්මි වාසනා කපුවැල්ල විසින් 2014.06.09 වැනි දින ලියා සහතික කල අංක 60 දරන ඇටර්නි බලය මගින් අපගේ ඇටර්නි බලකරු ලෙස මහරගම, ඉසිපතනාරාම පාර අංක 77/3, යන ලිපිනයෙහි පදිංචි රංගොඩගේ බෙනට් මෙන්ඩිස් ගුණවර්ධන වෙත කර ඇති පත්කිරීම සහ එම අංක 60 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවට සියලු දෙනා වෙත මෙයින් දන්වමු.

07-328

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කුරුණෑගල අලුත්මල්කඩුවාව 1 වන පියවර අංක 183 හි පදිංචි (දැනට ඕස්ට්‍රේලියාවේ රැකියාවේ නිරත) තෙන්නකෝන් මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා තෙන්නකෝන් වන මා විසින් නිකවැරටිය තැපැල් හිලෝගම පදිංචි රත්නමලල ඉරුගල් බණ්ඩාරලාගේ සේමසිංහ යන අය වෙනුවෙන් 2015.03.25 වැනි දින ඕස්ට්‍රේලියාවේ ඇටර්නි ජනරාල් ඉදිරිපිට දී අත්සන් කරන ලද කුරුණෑගල රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 82 කාණ්ඩයේ 6188 පත් ඉරුවේ 947 දිනපොත් අංකය යටතේ 2015.04.02 වැනි දින ලියාපදිංච කර ඇති ඇටර්නි බලපත්‍රය බලරහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර මින් පසුව ඔහු විසින් සිදුකරනු ලබන කිසිම ක්‍රියාවකට බලයකට ඔප්පුවකට හෝ කරුණකට ඔහු වෙනුවෙන් මම වග නොකියන බව ප්‍රකාශ කර සිටිමි.

තෙන්නකෝන් මුදියන්සේලාගේ ටිකිරිබණ්ඩා තෙන්නකෝන්.

07-604

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වන වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දක්වෙන ආයතන සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : හෝන්බිල් මයින්ස් ඇන්ඩ් මිනරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105314
ලියාපදිංචි දිනය : 2015.04.30
ලියාපදිංචි ලිපිනය : අංක 27/1, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

සමාගමේ නම : ලීඩ් හාඩ්වෙයා ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 104942
ලියාපදිංචි දිනය : 2015.04.06
ලියාපදිංචි ලිපිනය : අංක 27/1, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

සමාගමේ නම : කෝන් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105630
ලියාපදිංචි දිනය : 2015.05.15
ලියාපදිංචි ලිපිනය : 104/3, පිළියන්දල පාර, වෙහෙරහැර, බොරලැස්ගමුව.

සමාගමේ නම : ප්‍රෝකෙයා ලයිෆ් සයන්සස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105906
ලියාපදිංචි දිනය : 2015.06.17
ලියාපදිංචි ලිපිනය : අංක 02, කිල්ස් ග්‍රීන් ටෙරස් 1, කාහන්තොට පාර, පිට්ටුගල, මාළඹේ.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

අංක 27/1, පැපිලියාන පාර, නැදිමාල,
දෙහිවල.

07-338

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ප්‍රොපෙල් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2015.06.17
සමාගමේ අංකය : පී වී 106384
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 76/1, ස්ටැන්ලි පෙදෙස, පැපිලියාන පාර, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්.

07-357

---

## සාටෝ චෙමිෆා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය : පීවී 18035

2007 අංක 7 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ සමාගමේ ඈවරකර පත්කිරීමේ දැන්වීම

නුගේගොඩ, පැපිලියාන පාරේ, අංක 22/2 හි පදිංචි කේ. ජී. පී. විජයවර්ධන යන මම අංක 426, හෝකන්දර උතුර, හෝකන්දර දරන ස්ථානයේ පිහිටි සාටෝ චෙමිෆා ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි ඈවරකරු වශයෙන් 2015 ජුනි මස 02 වැනි දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී සාමාන්‍ය යෝජනා සම්මතයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ජී. පී. විජයවර්ධන,
ඈවරකරු.

07-408

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

තංගල්ල සීනිමෝදර, බීච් හවුස් හි පදිංචි ජේම්ස් වින්සන්ට් වෙස්ටර් ගෙස්ට් වන මා විසින් 2007 සැප්තැම්බර් 02 වැනි දින තංගල්ල, පල්ලික්කුඩාව පාර, අංක 13 පදිංචි ලියම් ජෝන් හිල් වෙත තංගල්ල ජී. ඊ. මුනසිංහ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 3009 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් එහි වූ කාර්යයන් සඳහා පැවරූ බලය අවලංගු කළ බව මෙයින් දැනුම් දෙමි.

ජේම්ස් වින්සන්ට් වෙස්ටර් ගෙස්ට්.

2014 අගෝස්තු මස 20 වැනි දින.

07-429

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

අංක 02, ගජබා පෙදෙස, කිරුළපන, කොළඹ 06 දරන ස්ථානයේ පදිංචි සෙල්වා ක්‍රිස්ටි ජෙයරාජා සිල්වෙස්ටර් වන මා විසින් මඩකලපුව, ඉරුදයපුරම් නැගෙනහිර, අංක 07 හරස් පාර, අංක 7 හි පදිංචි සෙල්වරාජා ජෙයරාජ් යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරන ලද මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ඩී විනෝබා ඉන්ද්‍රන් විසින් ලියා සහතික කරන ලද 2012 නොවැම්බර් මස 10 වැනි දිනැති අංක 17131 දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2015 ක් ජුනි මස 18 වැනි දින පටන් අවලංගුකර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් දැනුම් දෙන අතර 2015 ජුනි මස වන දින සිට එකී සෙල්වරාජා ජෙයරාජ් යන අය මා වෙනුවෙන් ඇතුළත් වන කිසිදු ගිවිසුමක් වෙනුවෙන් මා කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමු.

සෙල්වා ක්‍රිස්ටි ජෙයරාජා සිල්වෙස්ටර්.

2015 ජුනි මස 18 වැනි දින,
අංක 02,
ගජබා පෙදෙස, , කිරුළපන,
කොළඹ 06.

07-440

---

## දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : ලෙජන්ඩ් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106015
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 147/11, ලයන් සිටි, ලියනගේමුල්ල, සීදූව
සංස්ථාගත කළ දිනය : 2015.06.03

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-471

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම අප විසින් මෙලෙස පළ කරනු ලැබේ.

සමාගමේ නාමය : කේ එච් ආර් ඉන්වෙස්ට්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90409
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 324/1, හොරණ පාර, කුරුස හංදිය, අළුබෝමුල්ල.
සංස්ථාගත කළ දිනය : 2013 ජනවාරි 07 වැනි දින.

සමාගම් ලේකම්.

07-472

### ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සීමාසහිත ලයිව්රූම් පෞද්ගලික සමාගම, පී. වී. 106319,

ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 64/5, පිරිවෙන පාර, රත්මලාන
ලියාපදිංචි කළ දිනය : 2015 ජුනි 15

සී. ඩී. ගමගේ,
අධ්‍යක්ෂ.

07-485

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබ ඇති බව දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ඇමෙක්ස් ට්‍රේඩිං කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 74171
සංස්ථාගත කළ දිනය : 2011.09.06
ලිපිනය : අංක 240, මෙස්සන්ජර් වීදිය, කොළඹ 12

සුබ්‍රමනියම් තුරෙයිරාජ්,
ලේකම්.

කොළඹ 12.

07-496

---

### දැන්වීමයි

ග්ලැක්සෝස්මිත්ක්ලයින් ෆාමසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 2015 ජුනි 03 වැනි දින සංස්ථාගත කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ග්ලැක්සෝස්මිත්ක්ලයින් ෆාමසියුටිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105536
ලියාපදිංචි කාර්යාලය : අංක 121, ගාලු පාර, කල්දෙමුල්ල, මොරටුව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්)ලිමිටඩ්,
ලේකම්වරු.

07-497

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සී. කේ. ඔටෝ ඇක්සසරීස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 106345
ලියාපදිංචි දිනය : 2015.06.16
ලියාපදිංචි ලිපිනය : අංක 311, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-508

---

### ඇටර්නි බලය අවලංගු කිරීම

රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, දමහන, ඉහලගම, ගල්පොත්තේගෙදර යන ලිපිනයේ පදිංචි බඩහැල බද්දලාගේ පුංචි අප්පුහාමි වන මම 2011.11.22 දිනැතිව බලංගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. චන්ද්‍රසේකර මහතා සහතික කල අංක 12761 දරන ඇටර්නි බලපත්‍රය මගින් බලංගොඩ, කිරිමැටිතැන්න, අංක 131/1 පදිංචි සට්ටම්බි රාලලාගේ දෝන ශාන්ති රොස්මරී අර්සකුලරත්නට පැවරූ ඇටර්නි බලය 2015.06.20 වැනි දින සිට අවලංගු කර බලරහිත කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

07-529

---

### ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමෙ නම : ජේ පී එන් ලංකා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 106367
සංස්ථාපනය කළ දිනය : 2015.06.17
ලියාපදිංචි කාර්යාලය : අංක 530, හයිලෙවල් පාර, විජේරාම, නුගේගොඩ

සමාගමේ ලේකම්.

07-538

---

### ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමෙ නම : එන්. ඩී. එල්. කන්ස්ට්‍රක්ෂන් මැටීරියල් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 105628
සංස්ථාපන කළ දිනය : 2015.05.19
ලියාපදිංචි කාර්යාලය : අංක 1, පීටර්ස් පටුමග, පන්සල පාර, නුගේගොඩ.

සමාගමේ ලේකම්.

07-539

---

### ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමෙ නම : ෂාප් කන්සල්ටන්සි ඇන්ඩ් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 106005
සංස්ථාපන කළ දිනය : 2015.06.01
ලියාපදිංචි කාර්යාලය : අංක 15/2, මාදිවෙල පාර, ඇඹුල්දෙණිය, නුගේගොඩ.

සමාගමේ ලේකම්.

07-540

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනය**

නාවල, නාවල පාරේ, අංක 220 හි පිහිටි අංක පී. වී. 105400 දරන කොස්ටල් වින්ඩ් එන්ර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් 2015 මැයි 05 වැනි දින සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ.

07-568

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනය**

නාවල, නාවල පාරේ, අංක 220 හි පිහිටි අංක පී. වී. 105402 දරන වෙස්ට් වින්ඩ් එන්ර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් 2015 මැයි 05 වැනි දින සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ.

07-569

**නිවේදනයයි**

සමාගම් නිශ්වය කිරීම සඳහා 2007 අංක 7 පනත යටතේ පහත සඳහන් සමාගමේ නම් සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : නැන්ඩෝස් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 103815
සමාගම ලියාපදිංචි ලිපිනය : 197/1/1, ඩීන්ස් පාර, කොළඹ 10.

මොහම්මඩ් රෆිකුල් ඉස්ලාම් ඛාන්,
අධ්‍යක්ෂ.

07-585/1

**නිවේදනයයි**

සමාගම් නිශ්වය කිරීම සඳහා 2007 අංක 7 පනත යටතේ පහත සඳහන් සමාගමේ නම් සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ගැලෙක්සි වර්ල්ඩ්වයිඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 103671
සමාගම ලියාපදිංචි ලිපිනය : 197/1/1, ඩීන්ස් පාර, කොළඹ 10.

මොහම්මඩ් රෆිකුල් ඉස්ලාම් ඛාන්,
අධ්‍යක්ෂ.

07-585/2

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදේශ මත්පැන් තැබෑරුම**

2015/2016 වර්ෂය සඳහා වූ රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගු සෑම සුරා බදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරා බදු කොන්දේසිවලටත් මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා දෙල්තොට ප්‍රාදේශීය ලේකම්/අතිරේක දිසාපති තැන වන මා විසින් 2015.08.21 වැනි දින පෙ.ව. 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ම ලබාගත හැකි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

03. ටෙන්ඩර් සහ වත්කම් සහතිකය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු ය :-

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය ;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සාක්ෂිකරුගේ අත්සන යොදා තිබිය යුතු ය ;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් වෙනුවෙන් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙකී අවශ්‍යතාවයන් ට පටහැනිව ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රය -

*(අ)* ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවූ කුවිතාන්සිය,
*(ආ)* වත්කම් සහතිකය.

සමග ලියුම් කවරයක බහා සීල් තබා ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි ඉහළින් තැබෑරුමේ අංක සහ නම සඳහන් කර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාවට ප්‍රථම තැන්පත් කළ යුතු ය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම දෙල්තොට ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

05. රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව ඉහත සඳහන් පළවන ඡේදයේ සඳහන් කර ඇත. එකී වේලාවන්වල දී සියලුම ටෙන්ඩර්කරුවන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ පසු ප.ව. 2.30 ට පෙර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පතක් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතක් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

07. සියලුම මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රලත් ස්ථානවල විකිණීම සඳහා තොග (පීප්ප) අරක්කු නිකුත් නොකරන ලද බව සැළකිය යුතු ය.

08. ආරක්ෂිත හේතුවක් මත හෝ රජය මගින් නිකුත් කරනු ලබන හෝ වෙනත් යම් කරුණක් මත හෝ විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තබන කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

09. මීට පෙර විදේශ මත්පැන් සලක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් රජයට යම් මුදලක් ගෙවීමට තිබේනම් ටෙන්ඩරය පිළිගැනීමට ප්‍රථම එම හිඟ මුදල ගෙවා නිම කළ යුතු ය.

10. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකි ය.

ජේ. පී. යූ. කේ. ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2015 ජුනි මස 18 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

*මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කළ විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව - 2015/2016 වර්ෂය*

| *අනුක්‍රමික අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම විවෘත කර තබන කාලය සහ වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|
| විදේශ මත්පැන්හල | දෙල්තොට | දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2015.08.21 වැනි දින පෙ.ව. 10.30 දක්වා |

විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 1,000.00 ක් වේ.

07-320

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

HNB 210/14(iv)

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මඩකලපුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. සින්නයියා විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දවූ ද, 2011.11.21 දිනැති සහ අංක 8484දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම බෙන්ජමින් ජෙයකුලේන්ද්‍රන් (තනි අයිතිකරු බෙනාල් කන්ස්ට්‍රක්ෂන්) යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 21 වැනි දින ප. ව. 12.30 ට මෙම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේ පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝරලේපත්තු මධ්‍යම ප්‍රාදේශීය සභාවේ කෝරලේ පත්තුවේ කල්කුඩා ගමේ පාසිකුඩා වෙරල පාරේ පිහිටි පාසිකුඩා නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එළවරසු විසින් 2011.09.11 වැනි දින සාදන ලද ඊ/221/2011 දරන පිඹුරේ දක්වෙන ඉඩම ගොඩනැගිලි ළිඳ සහ එහි පිහිටි සියලු දේත් විශාලත්වය රූඩ් එකක් (අ. 0 රූ. 1 පර්. 0) (හෙක්. 0.101171)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.10.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2014.10.29 වැනි දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කල්කුඩා පාසිකුඩා මුහුදු වෙරළ ඔබ්බෙහි ඇති සතර මායිමෙන් වැටකින් සීමාවූ මෙම දේපළට සෘජු ප්‍රවේශයක් ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
0112 - 337707
ෆැක්ස් අංකය : 0112 - 509442.

07-536

---

HNB 210/14(i)

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මඩකලපුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වී. ඉන්ද්‍රන් විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දවූ ද, 2010.03.16 දිනැති සහ අංක 15592 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම බෙන්ජමින් ජෙයකුලේන්ද්‍රන් (තනි අයිතිකරු බෙනාල් කන්ස්ට්‍රක්ෂන්) යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 21 වැනි දින පෙ. ව. 9.00 ට මෙම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ පත්තුවේ මඩකලපුව මහ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 11 හි කොඞ්ඩායිමුනේ සුසාන භූමිය පාරේ වරිපනම් අංක 80/49 ''කුලවාඩි ප්‍රොස්පෙක්'' නමැති ඉඩම් කැබලි අංක 2 ට බලයලත් මිනින්දෝරු එච්. ජේ. ජේ. එස්තෝක්කුපිල්ලේ විසින් සාදන ලද අංක 13/13/2/1953 දරන පිඹුරේ ලොට් 5 බෙද වෙන් කොට බලය ලත් මිනින්දෝරු එස්. නාගලිංගම් විසින් මැන සාදන ලද අංක එස්එන්/94/2284 දරන පිඹුරේ ලොට් අංක

31 දරන ඉඩම් කට්ටිය නැවත මැන බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිස්ස වීරසිංහ විසින් 2009.01.10 වැනි දින සාදන ලද අංක 14/2009 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දක්වෙන ඉඩම සහ ගොඩනැගිලි සමග අනෙකුත් සියලු දේත්. විශාලත්වය පර්චස් දෙළහයි දශම දෙකයි පහක් (අ. 0 රූ. 0 පර්. 12.25) (හෙක්ටයාර් 0.03098)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.10.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2014.10.29 වැනි දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - මඩකලපුව, ත්‍රිකුණාමල පාරේ, කොඩ්ඩායිමුනේ පාලමේ සිට තන්ඩවාන්වැලි හන්දිය දක්වා කිලෝ මීටරයක් පමණ ගොස් එතැනින් දකුණට ඇති සීමා පාරට (Boundary Road) හැරී, දුම්රිය පාර හරස් මහ දක්වා කිලෝ මීටරයක් පමණ ගොස් සුසානභූමි පාරට වමට හැරී, පන්සල තෙක් මීටර් 800ක් පමණ ගමන් කොට දකුණට ඇති අඩි 20ක් පළල පුද්ගලික පාරට හැරී, එහි කෙළවර දක්වා මීටර් 400ක් පමණ දුරක් ගමන් කරන්න. මෙම දේපලේ සීමාව පාරේ වම් පැත්තේ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
0112 - 337707
ෆැක්ස් අංකය : 0112- 337707.

07-537

HNB 210/14(iii)

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මඩකලපුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. සින්නයියා විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දවූ ද, 2011.03.14 දිනැති සහ අංක 8216 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම බෙන්ජමින් ජෙයකුලේන්ද්‍රන් (තනි අයිතිකරු බෙනාල් කන්ස්ට්‍රක්ෂන්) යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 21 වැනි දින පෙ. ව. 11.00 ට මෙම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.*- නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේ පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝරලේපත්තු ප්‍රාදේශීය සභා සීමාවේ කෝරලේ පත්තුවේ පාසිකුඩා හි පාසිකුඩා වෙරළ පාරේ පිහිටි පාසිකුඩා පුම් නමැති ඉඩම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු ටී. එළවරසු විසින් 2011.02.13 වැනි දින සාදන ලද අංක ඊ/029/2011 දරන පිඹුරේ ඉඩම සමග ගොඩනැගිලි ළිඳ සහ එහි පිහිටි සියලු දේත්. විශාලත්වය : පර්චස් එකොළහයි දශම හතරයි තුනක් (අ. 0 රූ. 0 පර්. 11.43) (හෙක්. 0.028910)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.10.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2014.10.29 වැනි දින ලක්ම්බ, තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - හබරණ - මඩකලපුව මහාමාර්ගයේ කිරාන් හි කම්බුර්මුලෙයි හන්දිය දක්වා කිලෝමීටර් 28 ක දුරක් ගමන් කර කල්කුඩා පාරට දකුණට හැරී කිලෝ මීටර් 5 1/2 පමණ දුරක් ගොස් ප්‍රාදේශීය සභා පාරෙ (මුහුදු වෙරළ පාරේ) මීටර් 150ක් ඉදිරියට යනවිට එම පාරේ දකුණු සීමාවේ අදළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති

සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
0112 - 337707
ෆැක්ස් අංකය : 0112 - 509442.

07-533

---

HNB 210/14(v)

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මඩකලපුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. සින්නයියා විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දවූ ද, 2011.01.15 දිනැති සහ අංක 8169 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම බෙන්ජමින් ජෙයකුලේන්ද්‍රන් (තනි අයිතිකරු බෙනාල් කන්ස්ට්‍රක්ෂන්) යන අය ණයකරු වශයෙන් සහ මැනුවෙල් පිල්ලේ මතුරනායගම් උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 21 වැනි දින ප. ව. 1.30 ට මෙම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.*- නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් පත්තුවේ කොම්මතුරේ නමැති ගමේ පිහිටි අන්දරමඩුකඩ්ඩු ඉඩමේ බෙදූ කොටසට බලයලත් මිනින්දෝරු කේ. කණගරත්නම් විසින් 1977.12.15 වැනි දින සාදන ලද අංක 1314 දරන පිඹුරේ ලොට් 3 සහ 10 වශයෙන් දැක්වෙන ඉඩම සහ ගොඩනැගිලි සමග අනෙකුත් සියලු දේත්. විශාලත්වය අක්කර එකයි පර්චස් දහයයි (අ. 1 රූ. 0 පර්. 10) වන මෙය ඒ 130/84 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම වඩාත් මෑතක දී කරන ලද මැණීමකින් පසු ව බලයලත් මිනින්දෝරු ඒ. සිංහරාජා විසින් 2010.10.09 වැනි දින සාදන ලද අංක ඒ. එස්./10 ඊ. පී./177 දරන අන්දරමඩුකාඩ්ඩු නැමැති ඉඩම් කැබැල්ල. ගොඩනැගිලි, ළිඳ සහ එහි පිහිටි සියලු දේත්. විශාලත්වය රූඩ් තුනයි පර්චස් තිස්පහයි (අ. 0 රූ. 3 පර්. 35) (හෙක් 0.3920)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.10.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2014.10.29 වැනි දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - මඩකලපුව පොළොන්නරුව හඹරන ඒ 15 මහ මාර්ගයේ වෙන්කලඩි හන්දියේ සිට පොළොන්නරුව දෙසට මීටර් 200ක් පමණ ගමන් කොට වැලි මිශ්‍රිත පාරට දකුණට හැරී කි. මී. 1 1/4ක් ගමන් කරන්න. මෙම දේපලේ සීමාව දකුණු පැත්තේ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

